ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1901/5 – 2015 පෙබරවාරි 10 වැනි අඟහරුවාදා – 2015.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටබැද්දර (අ.ග.පි. 6) ගමේ පිහිටි මාතර දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක: එම්ආර්/පීටීබී/2014/190 හා 2014 අගෝස්තු මස 28 වැනි දිනැති පුගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ', 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 8.3 ක් පමණ වූ ඉඩම් කැබලි සඳහා මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තැන්නහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 4.0718**
උතුරට: ගල්පොත්ත දොල සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත; නැගෙනහිරට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත, කේ. ජී. නන්දසේන හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, කේ. ජී. ස්වර්ණපාල හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර සහ ඇල; දකුණට: කේ. ජී. නන්දසේන හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, කේ. ජී. ස්වර්ණපාල හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, ඇල සහ මාර්ගය; බටහිරට: ඇල සහ මාර්ගය, නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත සහ ගල්පොත්ත දොල.

02. **කැබලි අක්ෂර 'බී' – තැන්නහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 4.2282**
උතුරට: ටී. ජී. සෝමදාස හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, ඩබ්. සෝමසිරි හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත සහ මාර්ගය; නැගෙනහිරට: ආර්. ඒ. ගුණපාල සහ තවත් අය හිමිකම් කියන තැන්නහේන; දකුණට: ආර්. ඒ. ගුණපාල සහ තවත් අය හිමිකම් කියන තැන්නහේන, මාර්ගය, ටී. ජයතිස්ස හිමිකම් කියන කැතිගාන ඇල හේන, කේ. ජී. නන්දසේන හිමිකම් කියන කැතිගාන ඇල හේන සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත; බටහිරට: කේ. ජී. ස්වර්ණපාල හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, කේ. ජී. නන්දසේන හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, ටී. ජී. සෝමදාස හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර, ඩබ්. සෝමසිරි හිමිකම් කියන තැන්නහේන 16 කුඹුර සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2014/වීඊ/82.
ප්‍රාදේශිය ලේකම්ගේ යොමු අංකය: පීටීබී/එල්එන්ඩී/ඒසීකියුවීඅයි/7/26.
2015 පෙබරවාරි 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය.
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 680


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.